587

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2008 / 2009

සාධාරණත්වයේ මූලධර්ම – LWU 1202

කාලය – පැය 03 යි

දිනය : 2009. 03. 22 වේලාව: පෙ. ව. 9.30 - ප. ව. 12.30

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ.

## පළමු කොටස

මෙම කොටසින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

1. මුල් කාලයේදී සාධාරණත්වය විවිධ අංගයන්ගෙන් පොදු නීතියට නියුණු ලෙස පටහැනිව තිබිණි. කෙසේ වුවද පහළොස් වෙනි ශතවර්ෂයේ සිට පොදු නීතියේ බොහෝ අංග උකහා ගැනීම නිසා සාධාරණත්වයේ ස්වභාවය වෙනස් විය. මෙය සාධාරණත්වය පරිහානියට මග පෑදිය.

   උචිත නඩු තීරණ සහ ව්‍යවස්ථාවන් ඇසුරින් මෙම ප්‍රකාශය විශ්ලේෂණය කරන්න.

2. *Errington vs Errington* [1952] 1 KB 290 සහ *Bendall vs McWhirter* [1952] 2QB 466 යනාදී නඩු තීරණ වලදී සාධාරණත්වය තවමත් ප්‍රසව අවස්ථාව පසු කර නොමැති බව යෝජනා කළද, Bagnall විනිසුරු තුමන් විසින් එම කියමන තවදුරටත් සීමා කළේ, මූලධර්මයන් මත පදනම් වූ පූර්වාදර්ශයන් මඟින් එහි දරු මුණුපුරු පරම්පරාව සුජාත විය යුතු බව පවසමිනි.

   ඔබ Bagnall විනිසුරුතුමාගේ මතය සමග එකඟ වන්නේද? උචිත නඩු තීරණ සහ ව්‍යවස්ථාවන් උදාහරණ ලෙස දක්වමින් ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

## දෙවන කොටස

මෙම කොටසින් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

3. පහත දෙන ලද අවස්ථාවන්හිදී පාර්ශවකරුවන්ගේ නෛතිකභාවය සාකච්ඡා කරන්න.

   (1) බාලසූරිය තම 'රස භෝජන' නමැති පිටිකෑම වෙළඳ සැළ තම පුතු නිමල්ට තෑගි කිරීමට බලාපොරොත්තු වේ. නමුත් නිමල් ණය වී සිටි බැවින් එම දේපල නිමල්ගේ සොයුරිය වූ නයනාට පැවරීය.

(2) මාලනී කිරිබත්ගොඩින් ඉඩමක් මිලදී ගෙන එහි ඔප්පුව කුසුමරත්න නමින් ලියා පදිංචි කළේය. ඒ අවස්ථාව වන විට ණය අය කර ගැනීමේ නඩුවක් මාලනීට විරුද්ධව අධිකරණයේ විසදීමට තිබිණි. එම නඩුකරය අවසන් වූ පසුව එම ඉඩම නැවතත් මාලනීට පැවරීමට කුසුමරත්න එකඟවිය. ඉඩම ලියාපදිංචියෙන් මාස හයකට පසු එම පැවරීම සිදු වූයේ නීතිවිරෝධී අරමුණකට බව කියා සිටිමින් කුසුමරත්න විසින් එම ඉඩමට පරම හිමිකම ඉල්ලා සිටී.

4. (1) ශ්‍රී ලංකාවේ වලංගු පුණ්‍ය භාරයක් ඇති කිරීම සඳහා කොන්දේසි දෙකක් සැපිරිය යුතුවේ. මෙම කොන්දේසි භාරයේ අභිමතාර්ථ හා සම්බන්ධ වේ. පළමුව, පුණ්‍ය භාරය, පුණ්‍ය යන්නෙහි නෛතික අර්ථ නිරූපණයට අනුකූල විය යුතු අතර සහ දෙවනුව, පොදු යහපත පිළිබඳව පරීක්ෂණය සම්පූර්ණ කළ යුතුය. වලංගු පුණ්‍ය භාරයක් සංස්ථාපනය කිරීම සඳහා දෙවන අවශ්‍යතාවය තීරණාත්මක වන්නේය. එයට හේතු වන්නේ පුණ්‍ය යන්නෙහි නෛතික අර්ථය තුළට ඇතුළත් වුවත් පොදු යහපත යන පරීක්ෂණය තෘප්තිමත් නොකිරීම නිසා පුණ්‍ය භාර වලංගු නොවීමයි.

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. තවත් අධිකරණ බල සීමාවක නීතිය සමඟ ඔබගේ පිළිතුර සැසදීම සහ වෙනස්කම් දැක්වීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(2) සයිප්‍රස් සිද්ධාන්තය කෙටියෙන් පහදා දෙන්න. උචිත නඩු තීරණ සහ ව්‍යවස්ථා ප්‍රතිපාදන ඇත්නම් එමගින් ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

5. සුමනපාල 2005 දී මිය යන තුරුම කරුවලගස්වැව හෝටලයක් පවත්වා ගෙන ගියේය. 1952 දී ඔහු පුත්තලමෙන් ඉඩමක් මිලදී ගත් නමුත් එය ඔහුගේ පුතු සුසිල් ගේ නමට ලියා තිබුණි. මියයන තුරුම සුමනපාල එම ඉඩමේ සන්තකය දැරීය. ඔහු එම ඉඩම වගා කළ අතර ඉන් ලැබුන අස්වැන්න හෝටලය පවත්වාගෙන යාමට භාවිතා කරන ලදී. ඉඩමෙන් කොටසක් කමල්ට බදු දෙන ලද අතර ඉන් ලද ආදායම හෝටලය පිළිසකර කිරීමට යොදා ගන්නා ලදී. තමන් හදා ගත් දියණියන් දෙදෙනා වන උදේනි සහ ශලිනිට එම ඉඩම හිමිවිය යුතු බවට වන තම කැමැත්ත සුමනපාල විසින් 1990 දී ලියන ලද ලේඛණයක ප්‍රකාශ කොට තිබිණි. සුමනපාලගේ මරණින් පසු 2005 දී පුත්තලමේ ඇති ඉඩමට උදේනි සහ ශලිනී අයිතිවාසිකම් කියා සිටී.

සුසිල්ට උපදෙස් දෙන්න.

6. අවිවාහක ස්ත්‍රියක් වන රමණී 1998 දී තම සොයුරා වන ප්‍රියන්තට හෝමාගම පිහිටි තම ඉඩම තෑගි කළේය. මෙය අවලංගුකළ නොහැකි ත්‍යාගයක් විය. එම ඉඩමේ වාසය කරන ලෙස රමණී ඉල්ලා සිටි බැවින් ප්‍රියන්තගේ බිරිඳ වන නිමාලි සහ පුතු වන සුමන් 2000 වසරේ සිට එම ඉඩමේ වාසය කළහ. කෙසේ වුවද, රමණී මෙම ඉඩම ප්‍රියන්තට තෑගි දී ඇති බව ඔවුන් දැන සිටියේ නැත. මංජුලාට ඉඩමේ කොටසක් බලා ගැනීම සඳහා දෙන ලදි. 2002 දී ප්‍රියන්තගේ මරණින් පසුව තම මස්සිනා වන ප්‍රභාත්ට එම ඉඩම රමණී විසින් තෑගි දුනි. නිමාලි සහ සුමන්ව නෙරපීමට ප්‍රභාත් සහ රමණී දැන් උත්සාහ කරති. 1998 දී සිදු කරන ලද අවලංගුකළ නොහැකි

ත්‍යාගය පිළිබඳව නිමාලි සහ සුමන්ට දැනගන්නට ලැබේ. මේ අතරතුර මංජුලා තමන්ට බලාගැනීමට දුන් ඉඩමේ කොටසක් විකුණුවාය.

(1) නිමාලීට සහ සුමන්ට උපදෙස් දෙන්න.

(2) මංජුලා විසින් විකුණන ලද ඉඩමේ කැබැල්ල පිළිබඳව නෛතික තත්වය කුමක්ද?

7. (1) භාරකරුවකු තම යුතුකම් ඉටුකිරීමේදී ඉහළ මට්ටමක ව්‍යාපාරික නිපුණතාවක් රැකිය යුතු බවට අපේක්ෂා කළද, එය නීතියෙන් අපේක්ෂා කරන්නාවූ පරම අවශ්‍යතාවක් ලෙස සැලකිය නොහැක.

භාරකරුවන්ගේ අයිතිවාසිකම් සහ යුතුකම් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

(2) අර්ථලාභියකු වෙත පැවරෙන වඩාත්ම වැදගත් අයිතියක් ලෙස සලකන්නා වූ භාර දේපල හඹා යාමේ අයිතිවාසිකම පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

8. පහත සඳහන් ඕනෑම **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(1) භාර වර්ගීකරණය.
(2) භාරයක් නිර්මාණය කිරීමට පාර්ශවකරුවන්ට ඇති හැකියාව.
(3) අර්ථලාභියාගේ අනන්‍යතාව.
(4) වල්ලි අම්මා vs මපිඩි (1998) 45 න.නී.වා. 169.

හිමිකම් ඇවිරිණි
***********